# Sinhalese Grammar

for

## Standard IV.

by

The Revd. Theodore G. Perera.

# සිංහල ව්‍යාකරණ

හතරවෙනි ප්‍රමාණයට

ගෞ. තියඩෝර් ජී. පෙරේර උන්නාන්සේ

විසින්

ආණ්ඩුවේ ව්‍යවස්ථාපොතට එකඟව

සම්පාදනය කරනලදී.

කොළඹ

ලඞ්කාතිලක යන්ත්‍රාලයේ

මුද්‍රිත යි.

**1909.**

පොතක මිල ශත 10 යි.

# Sinhalese Grammar

for

## Standard IV.

by

The Revd. Theodore G. Perera.

# සිංහල ව්‍යාකරණ

හතරවෙනි ප්‍රමාණයට

ගෞ. තියඩෝර් ජී. පෙරේරා උන්නාන්සේ

විසින්

ආණ්ඩුවේ ව්‍යවස්ථාපොතට එකඟව

සම්පාදනය කරනලදී.


කොළඹ

ලඞ්කාතිලක යන්ත්‍රාලයේ

මුද්‍රිත යි.

1909.

# සිංහල ව්‍යාකරණ.
# Sinhalese Grammar.

## I. ප්‍රාරම්භය.
## Introduction.

1. යම් භාෂාවක් නිරවද්‍යලෙස ලියන්ට කියන්ට උගන්වන ශාස්ත්‍රය ව්‍යාකරණ නම්. එහෙයින් සිංහල භාෂාව නිවැරදි ලෙස ලියන්ට කියන්ට උගන්වන ශාස්ත්‍රය **සිංහල ව්‍යාකරණ** නම්වේ.

2. සිංහල භාෂාව වනාහි අමිශ්‍ර සිංහලය, මිශ්‍ර සිංහලය කියා කොටස් දෙකකට බෙදේ. මාගධ සංස්කෘතාදි භාෂාන්තර වචන හා මිශ්‍ර නොවූ භාෂාව අමිශ්‍ර සිංහල නම්. මාගධ සංස්කෘතාදි අන්‍ය භාෂාවල ශබ්ද අතරතුර වැටී මිශ්‍රවූ භාෂාව මිශ්‍ර සිංහලයි. කවි පදබැඳුම් ශුද්ධසිංහල භාෂාවෙන්ද, ගද්‍ය කාව්‍ය රචනාව සහ කථාව්‍යවහාරය මිශ්‍ර සිංහලෙන්ද කරනුලැබේ.

3. භාෂාවක්වූකලී ශබ්දයන්ගෙන් යුක්තයි. ශබ්දයන් ප්‍රකාශකරන පිණිස යොදනු ලබන ලකුණු අකුරුයයි කියනු ලැබෙත්. ඒ අක්ෂර හඳුන්වන පිළිවෙල **හෝඩිය** නම්වේ. සිංහල භාෂාව උගන්නා අය විසින් ශුද්ධ සිංහල හෝඩියද, මාගධ සහ සංස්කෘත හෝඩිද දතයුත්තෝය. මේ තුනම එක්වූකල මිශ්‍ර සිංහල හෝඩිය සෑදේ.

## II. හෝඩියේ අකුරු සහ ඔවුන්ගේ වර්ග.
## Letters of the Alphabet and their Classification.

4. අමිශ්‍ර සිංහල භාෂාවේ අකුරු තිස්දෙකකි. එනම්:—

අ ආ (ඇ ඈ*) ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ,

කගජ ටඩණ තදන පබම ය ර ල ව ස හ ළ අං යන මෙයි.

ශුද්ධ සිංහලෙන් ලියනකල මේ අක්ෂර පමණක් ව්‍යවහාරවේ.

5. මාගධ භාෂාවේ අකුරු හතලිස්එකක්වෙත්. එනම්:—

අ ආ ඉ ඊ උ ඌ එ†ඔ

කඛගඝඞ, චඡජඣඤ, ටඨඩඪණ, තථදධන, පඵබභම, යරලව සහළ අං යන මෙයි.

6. සංස්කෘත භාෂාවේ අක්ෂරයෝ සතලිස් නව යෙක් වෙති. එනම්:—

අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ ඔ ඖ

කඛගඝඞ, චඡජඣඤ, ටඨඩඪණ, තථදධන, පඵබභම, යරලව ශෂසහ (අ)ං (අ)ඃ—යන මොහුය.

---

*ඇ,ඈ දෙක අ,ආ දෙකේ මාත්‍රාවෘඩියයි සිදත්සඟරාවේ කියාතිබේ. ඒ අන්දමට ශුද්ධ සිංහල භාෂාවේ ඇත්තේ අක්ෂර තිසක් පමණකි. නුමුත් දැන් ඇ ඈ යන අක්ෂරවයත් වෙනම අක්ෂර දෙකක්කොට සලකනුලැබෙත්.

†මාගධ භාෂාවෙහි ඇතැම්විට එ, ඔ, දෙක හ්‍රස්වවශයෙන්ද කියවෙන හෙයින් ඊට අයිති අකුරු හතලිස් තුනක්යයිද කිසිවෙක් සලකති.

7. යට දක්වූ හෝඩි තුනේම අක්‍ෂර එකතුවී මිශ්‍ර සිංහල හෝඩිය සෑදේ. එහි ව්‍යවහාරවන අකුරු පනස්හතරෙක් වෙත්. එනම්:—

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඒ ඓ ඔ ඕ ඖ, කඛගඝඞ, චඡජඣඤ, ටඨඩඪණ, තථදධන, පඵබභම, යරලව ශෂසහළ (අ)ං (අ)ඃ යන මෙයි.

**සැලකියයුතුයි:**— ඍ ඎ ඏ ඐ ඓ ඖ ශ ෂ (අ)ඃ යන අකුරු නවය සංස්කෘත භාෂාවට පමණක් අයිතිය. නුමුත් මාගධයෙහි හා සිංහලෙහි ඇති ළ යන්න ව්‍යවහාර සංස්කෘතයෙහි නොමැතිය. මාගධ සංස්කෘත භාෂාවල ඇති ඛ ඝ ඞ ඡ ඣ ඤ ඨ ඪ ථ ධ ඵ භ යන අකුරු දහතුන ශුද්ධ සිංහලෙහි නැත. නුමුත් ඇ, ඈ, දෙක ඇත්තේ ශුද්ධ සිංහලෙහි පමණකි. හ්‍රස්ව එ, ඔ, දෙක සංස්කෘතයෙහි නොපෙනේ. ඒ නිතරම සංස්කෘතයෙහි දීර්ඝවම ශබ්දකෙරේ. මාගධයෙහි එත්ථ සෙය්‍යො ඔට්ඨො සොත්ථි යනාදි තැන්වල සංයොගයකට පූර්වයෙහිදී එ, ඔ, යනු සිංහලෙහි මෙන් හ්‍රස්ව ලෙස ශබ්දකෙරේ.

## 1 වෙනි අභ්‍යාස පාඨය.

මෙහි පහත දක්වන වාක්‍යවල ඇති මාගධ, සංස්කෘත, සිංහල යන භාෂාත්‍රයටම හිමි අක්‍ෂරද, මාගධයට හා සිංහලට පමණක් හිමි අක්‍ෂරද, මාගධයට හා සංස්කෘතයට පමණක් අයිති අකුරුද, සංස්කෘතයට පමණක් අයත් අක්‍ෂරද, සිංහල භාෂාවට පමණක් අයිති අකුරුද, වෙන්කොට පෙන්වනු.

ශීත ඍතුවේ ඇතම් රටවල දිය මිදේ. වර්ෂාව රටක් සාරවත් කිරීමට ආධාරවත්ය. දුශ්චරිතය මනුෂ්‍යයා අධම ස්වභාවට පමුණුවයි. නිතරම ඇත්ත කථාකරනු. පෘථිවිය ගෝලයක්සේ වටය. ඈ උත්තම

සත්‍රියක. දුර්ජන සමාගමෙන් වළකිනු. ළදරුවෝ මව්පියන් ප්‍රීතිකරවත්. ලඞ්කාව පියකරු රටකි. සිංහල භාෂාවට එළුව කියාද ව්‍යවහාර වේ. දුඃඛප්‍රාප්ත අසරණයන්ට පිහිටවෙනු. සියල්ලන් කෙරෙහි මෛත්‍රීප්‍රේමය පවත්වව්. මරණය දක්වා සදාචාරයෙහි යෙදෙනු.

## ස්වර සහ ව්‍යඤ්ජන.

## Vowels and Consonants.

---

8. යට දක්වනලද අක්ෂරයෝ ස්වරය ව්‍යඤ්ජනයයි කොටස් දෙකකට බෙදෙති.

අමිශ්‍ර සිංහල හෝඩියෙහි අ යන්න පටන් ඕ යන්න දක්වා ඇති අකුරු දොළහ ස්වරයි. අනික් විස්ස ව්‍යඤ්ජනයි.

මාගධ සෝඩියේ අ යන්න පටන් ඔ යන්න දක්වා ඇති අකුරු අට ස්වරයි. අනික් තිස්තුන ව්‍යඤ්ජනයි.

සංස්කෘත සෝඩියෙහි අ යන්න පටන් ඖ යන්න දක්වා ඇති අකුරු දහසතර ස්වරයි. අනික් තිස්පහ ව්‍යඤ්ජනයි.

## 2 වෙනි අභ්‍යාස පාඨය.

මෙහි පහත ඇති වාක්‍යයන්හි ස්වර සහ ව්‍යඤ්ජන වෙන්වශයෙන් දක්වනු.

අද උදේ වැසිවැස්සේය. ඊයේ අපේ පාඨශාලාවට අලුත් ගුරුවරයෙක් ආවේය. අපවිත්‍රයා ඌරෙකු හා සමානය. ඍජුගුණය අනගිමයි. ඓහලෞකික සැපත පමණක් සෙවීම මනුෂ්‍යයාට නොහොබී. ඕතෙර අං ඇති මුවෙක් සිටී. එකටඑක කිරීමට පුරුදු නොවෙනු.

## ස්වර.

### Vowels.

9. ස්වරනම් තනිතනිවත් ශබ්දකළ හැකි නොහොත් ශබ්ද උපදවන අක්ෂරයි. මේ අකුරුවලට ශුද්ධ සිංහලෙහි පණකුරු, සර, නිසිසය යන නාම ව්‍යවහාර වෙති. මීට ප්‍රාණාක්ෂර, නිශ්‍රයාක්ෂර යන නාමද සංස්කෘතයෙහි දීතිබෙත්. තනිව ශබ්දකළ නොහැකි ව්‍යඤ්ජනයන්ට පණදෙන හෙයින් ප්‍රාණාක්ෂර කියාද, ඒ ව්‍යඤ්ජනයන් හා සම්බන්ධවන හෙයින් නිශ්‍රයාක්ෂර කියාද ඊට ඒ නම් යෙදී තිබෙත්.

10. ස්වරයෝ හ්‍රස්වය, දීර්ඝයයි කොටස් දෙකකට බෙදෙත්. ලුහුඩු ශබ්ද ඇති නොහොත් ඇදලා නොකියවෙන අකුරු හ්‍රස්ව නම්. දීර්ඝ ශබ්දඇති නොහොත් ඇදලා කියවෙන අකුරු දීර්ඝ නම්. හ්‍රස්වාක්ෂරයන්ට ලඝුයයිද, දීර්ඝාක්ෂරයන්ට ගුරුයයිද කියාත් ව්‍යවහාර වේ. ශුද්ධ සිංහලෙහි ඔවුන්ට ලුහු සහ ගුරුයයිද කියනුලැබේ.

අමිශ්‍ර සිංහල හෝඩියේ අ, ඇ, ඉ, උ, එ, ඔ යන අකුරු හය හ්‍රස්වයෝ හෙවත් ලුහු අකුරුයි.
ආ, ඈ, ඊ, ඌ, ඒ, ඕ යන අකුරු හය දීර්ඝයෝ හෙවත් ගුරු අකුරුයි.

මාගධ හෝඩියේ අ, ඉ, උ, යන අකුරු තුන හ්‍රස්වයෝයි. එ, ඔ, යන අකුරු දෙකද සංයෝගයකට පූර්වයෙන් ආකල හ්‍රස්ව මෙන් කියවනුලැබෙත්. ආ, ඊ, ඌ, සහ සංයෝගයකට පූර්වයෙන් නොවූ එ, ඔ යන අක්ෂර දෙකත් දීර්ඝයෝයි. සංස්කෘත හෝඩියේ අ, ඉ, උ, ඍ, ඏ, යන අකුරු පස හ්‍රස්වයෝයි. ආ, ඊ, ඌ, ඎ, ඐ, එ, ඓ, ඔ, ඖ යන අකුරු නවය දීර්ඝයෝයි.

11. සංස්කෘත භාෂාවෙහි, දීර්ඝ අක්ෂරයකටත් වඩා ඇදලා කියවන අකුරුවලට ප්ලුතයයි කියනු ලැබේ. ඊට ලිවීමේදී අක්ෂර රූපයක් නොමැත්තේය. ශබ්ද කිරීමේ කාලය අනුව ඒ පවතී. දුරසිටිනවුන්ට හඬ ගැසීමෙහිද, ගායනා කිරීමෙහිද ඇඬීමෙහිද ඒ ව්‍යවහාරවේ. එබැවින් සංස්කෘත වෛයාකරණයෝ අ, ඉ, උ, ඍ, ඏ යන වර්ණ පස හ්‍රස්ව, දීර්ඝ, ප්ලුත, වශයෙන් තුන් විධියකට දක්වති. හ්‍රස්වයක් ශබ්ද කිරීමට යන කාලය මාත්‍රාවයයි කියනු ලැබේ. එබැවින් එක මාත්‍රාවක් ඇති අකුර හ්‍රස්ව නම්. මාත්‍රා දෙකක් ඇති අකුර දීර්ඝ නම්. මාත්‍රා තුනක් ඇති අකුර ප්ලුත නම්.

**සැලකියයුතුයි.** සංස්කෘත භාෂාවේ එ, ඔ, දෙක නිතරම දීර්ඝය. ඒ නිසා ඒ ඇදලා කියවිය යුතුය. මාගධ භාෂායෙහි සංයොගයකට මුලින් නොපිහිටි එ, ඔ, දෙකද නිතරම දීර්ඝය. එඩක, එලක, ඔජස, ඔජ, යන ශබ්දවල එ, ඔ, යන අකුරු දීර්ඝවම ශබ්දකළ යුතුය. දැන් ඇතැම්විට මිශ්‍ර සිංහලෙහි දෙශය, ලොකය, ගොළිය, යනාදි වචන දේශය, ලෝකය, ගෝළිය යන අන්දමටද ලියනුලැබේ.

**3 වෙනි අභ්‍යාස පාඨය.**

මෙහි පහත දක්වන ශබ්දවල ඇති නන් ස්වරයන්ගේ ලඝු ගුරු වෙන්කොට පෙන්වනු.

ආගම්, ඊතල, උදෑසන, ඍතුව, ඔදන, ඖෂධ, එඩක, ඓශ්වර්‍ය්‍ය, අටපහ, ඉරියව්, ඔජස, ඔද, එදු, ඕතෙර, ඒදන, ඍණ, ඌන, ඍණකාර, ඖෂධ, එරණ්ඩ.

**ව්‍යඤ්ජන.**

**Consonants.**

12. ව්‍යඤ්ජනාක්ෂර නම් තනියම ශබ්දකරන්ට අමාරුවූ හල් අකුරුයි. මිට ප්‍රථම ඒවා ක, ග, ජ, ආදී

වශයෙන් දක්වනලද නමුත් ස්වභාවයෙන් ක්, ග්, ජ්, ආදි වශයෙන්ම සිටිත්. මේ අල් අකුරු තනියම ශබ්ද කිරීම දුෂ්කර හෙයින් ඒවාට අ යන ප්‍රාණාක්‍ෂරය යොදා ක, ග, ජ, ආදි වශයෙන් ලියන ලදහ. ශුද්ධ සිංහලෙහි හල් අකුරු, හසකුර, ගතකුරු, නිසිත යන නාම ඊට ව්‍යවහාර කරනුලැබෙත්. සංස්කෘත භාෂායෙහි ඊට ගාත්‍රාක්‍ෂර, නිශ්‍රිතාක්‍ෂර යන නාමද දී තිබෙත්.

ව්‍යඤ්ජන ස්වරයන්ට අවයව වශයෙන් පිහිටන හෙයින් ගතකුරු හෙවත් ගාත්‍රාක්‍ෂර කියාද, ස්වරයන් හා සම්බන්ධකරනු ලැබෙන හෙයින් නිසිත හෙවත් නිශ්‍රිතාක්‍ෂර කියාද කියනු ලැබෙත්

ඇතම් සංස්කෘත වෛයාකරණයෝ ප්‍රත්‍යාහාර ගැනීමේදී ව්‍යඤ්ජනාක්‍ෂර හ යන්නෙන් පටන්ගෙන ක්‍ෂ යන්නෙන් අන්තිමකළ හෙයින් ඒ අකුරු දෙක එක්කොට හස සංඥව ව්‍යඤ්ජනයන්ට යොදා තිබේ.

13. ව්‍යඤ්ජනාක්‍ෂර ප්‍රකෘතියෙන් අල්අකුරුව පවතින නමුත් ඊට ස්වර සංයුක්ත කිරීමෙන් ඒ අල් බව අත්හැරී ශබ්දකළ හැකි අක්‍ෂරවලට පෙරළෙත්. ක් යන්නට අ යන්න ලූකල ක යන ශබ්දය නැගෙයි. ආ යන්න ලූකල කා යන ශබ්දය නැගේ. මේ අන්දමට මිශ්‍ර සිංහලට අයිති ස්වර 18 ව්‍යඤ්ජනයන්ට ආරූඪකිරීමෙන් එක එක ව්‍යඤ්ජනාක්‍ෂරය 18 විධියකට ශබ්දවේ. එසේ ස්වර සංයුක්ත ව්‍යඤ්ජනයන් ලිවීමේදී ස්වර හඟවන ලකුණු කොටසෙක්ද භාවිතාවේ. ඒවාට පිලියයි කියති. ව්‍යඤ්ජනාක්‍ෂර ස්වර හා ගැලපෙන ක්‍රමයද, ස්වර හඟවන පිලි ලකුණු හා ඒවායේ නම්ද මෙහි පහත දක්වනු ලැබෙත්.

සංයෝගවෙත්. අකුරු සටකීලෙස රූපයේ කොටසක ලකුණක් ඇතිව සංයෝගවන අන්දම ඒ ශබ්ද සමග මෙහි පහත යොදනු ලැබේ.

| ශුඩ සිංහලෙහි | බැඳිඅකුර | ශබ්ද. |
|---|---|---|
| ( (බින්දුවෙන් අභිය) + ග = ඟ | | අඟ |
| ( (ණ් යන්නෙන් අභිය) + ඩ = ඬ | | සැඬ |
| ( (න් යන්නෙන් අභිය) + ද = ඳ | | ලිඳ |
| ( (ම් යන්නෙන් අභිය) + බ = ඹ | | අඹ |

ශුඩ සිංහලෙහි මෙලෙස බැඳෙන අභිසංයෝගයට සඤ්ඤකයයි කියති. "ඹ" යන්නට අඹවයන්න යයි කියනුලැබේ.

### මිශ්‍ර සිංහලෙහි

1. අකුරු දෙකක් පමණක් සංයෝගවන සථාන.

| බැඳිඅකුරු. | ශබ්ද. | බැඳිඅකුරු | ශබ්ද. |
|---|---|---|---|
| ක් + ෂ = ක්‍ෂ | = පක්‍ෂ | ත් + ථ = ත්‍ථ | = අත්‍ථ |
| ක් + ය = ක්‍ය | = වාක්‍ය | ත් + ව = ත්‍ව | = සත්‍ව |
| ක් + ර = ක්‍ර | = චක්‍ර | ද් + ධ = ද්‍ධ | = බද්‍ධ |
| ක් + ව = ක්‍ව | = පක්‍ව | ද් + ව = ද්‍ව | = ද්‍වය |
| ග් + ධ = ග්‍ධ | = විදග්‍ධ | න් + ථ = න්‍ථ | = ග්‍රන්‍ථ |
| ජ් + ඤ = ජ්‍ඤ | = අජ්‍ඤ | න් + ද = න්‍ද | = තන්‍ද |
| ඤ් + ච = ඤ්‍ච | = පඤ්‍ච | න් + ධ = න්‍ධ | = අන්‍ධ |
| ඤ් + ජ = ඤ්‍ජ | = කුඤ්‍ජ | න් + ව = න්‍ව | = අන්‍ව |
| ට් + ඨ = ට්‍ඨ | = දුට්‍ඨ | ර් + ග = ර්‍ග | = වර්‍ග |

**සැලකිය යුතුයි.** 1. ය යන්නෙහි සලකුණවූ "්‍ය" යන්නට යංශය යයි කියනු ලැබේ. යංශය නිතරම යෙදෙන්නේ හල්අකුරකට පරවය. "්‍ර" යන්නේ සලකුණවූ "්‍ර" යන්නට රෙඵයයි කියනු ලැබේ. ඒ ව්‍යඤ්ජනයක මුදුනේ යෙදේ.

කියවීමේදී රේඵය ඒ බැඳෙන ව්‍යඤ්ජනයට පළමු වෙන්ශබ්දකළ යුතුය. ර යන්නේ සලකුණවූ "ු" යන්නට රකාරාංශයයි කියනු ලැබේ.

2. "ච + ච" යන්න සමහර තැනක "ඡ" යන්න මෙන් ලියනුලැබේ. ඊට පාළි චයන්නයයි ඇතම් අය කියති. "ණ් + ඩ" යන්න සමහර තැනක ඬ යන්න මෙන් ලියනුලැබේ. "බ් + බ" යන්න සමහර තැනක ඞ යන්න මෙන් ලියනු ලැබේ. ඊට ඇතම් අය සබ්බ බයන්නයයි කියති. ම් + බ යන්න සමහර තැනක ඹ යන්න මෙන් ලියනුලැබේ. නුමුත් මේවායේ ව්‍යවහාරය දැන් ඉතා විරලය.

———0———

2. අකුරු තුනක් සංයෝගවන ස්ථාන.

| | |
|---|---|
| ක් + ෂ් + ණ = ක්ෂ්ණ | තීක්ෂ්ණ |
| ක් + ෂ් + ම = ක්ෂ්ම | සූක්ෂ්ම |
| ඞ් + ක් + ති = ඞ්ක්ති | පඞ්ක්ති |
| න් + ත් + ර = න්ත්‍ර | යන්ත්‍ර |
| න් + ද් + ර = න්ද්‍ර | චන්ද්‍ර |

මෙහි ඇතම් අකුරු සම්පූර්ණයෙන් බැඳේ.

**5 වෙනි අභ්‍යාස පාඨය.**

මෙහි පහත දක්වන පාඨයන්ගේ ස්වර ව්‍යඤ්ජන වෙන්කරනු. 1. පූර්ණාලෝකය 2. චන්ද්‍රකාන්තිය 3. කෘෂ්ණාඞ්ගනාව 4. දන්තෞෂ්ඨජය 5. සංස්කෘත භාෂාව 6. ගාත්‍රාක්ෂරය 7. ආශ්චර්‍ය්‍යය 8. ශක්‍රෛශ්චර්‍ය්‍ය වර්ණන 9. ශ්‍රී විභූති 10. දිව්‍යෛශ්චර්‍ය්‍ය.

**ව්‍යඤ්ජනාක්ෂරයන්ගේ බෙදීම.**

15. මාගධ සංස්කෘත, හෝඩිවල ව්‍යඤ්ජනයන්ගෙන් ක යන්න පටන් ම යන්න දක්වා ඇති අකුරු

පස්විස්ස එකකොටගේ අකුරු පසක් බැගින් කොටස් 5 කට බෙදුනිබෙත්. ඒ මෙලෙසයි: —

| | |
|---|---|
| ක ඛ ග ඝ ඞ | කවර්ගයයි |
| ච ඡ ජ ඣ ඤ | චවර්ගයයි |
| ට ඨ ඩ ඪ ණ | ටවර්ගයයි |
| ත ථ ද ධ න | තවර්ගයයි |
| ප ඵ බ භ ම | පවර්ගයයි. |

මිට ස්පර්ශාක්ෂර යනි නාමයද දී තිබේ.

16. මේ වර්ගයන්ගේ ඞ, ඤ, ණ, න, ම යන අග අකුරු පස නාසිකාවෙනුත් කියවෙන හෙයින් ඊට **අනුනාසිකා** යයි නම්කරතිබේ.

17. "යරලව" යන අකුරු සතර **අන්තඃස්ථ** යයි කියනුලැබෙත්. ඒවා වර්ගයත් හා ඌෂ්මාක්ෂර අතරේ පිහිටි හෙයින් ඒ නම ලබා තිබෙත්.

18. "ශෂසහ" සතර **ඌෂ්මාක්ෂර** යයි කියනුලැබේ. ඒවා උණුසුම් සහිත වාතයෙන් උච්චාරණය කෙරෙන හෙයින් ඒ නම ලබා තිබෙත්.

19. ං යන බින්දුවට සංස්කෘතයෙහි **අනුස්වාර** යයි කියනුලැබේ. ස්වරය අනුව පවතින හෙයින් ඊට ඒ නාමය දීතිබේ. නිතරම ඒ පැමිණෙන්නේ ස්වරයකට පරවය. කෙවල බින්දුවෙහි ප්‍රයොගයෙක් නැත්තේය. ඊටපාළි ව්‍යාකරණයෙහි **නිග්ගහීත** යයි නම්කර තිබේ.

20. ඃ යන්නට **විසර්ජනීය** යි කියනුලැබේ. හුස්ම පිටකරන යන අර්ථයෙන් ඒ නම දීතිබේ. **විසර්ග** යනුද ඊට ඇති තවත් නාමයකි.

21. ව්‍යඤ්ජනයෝ **අල්පප්‍රාණය, මහාප්‍රාණයයි**. තවත් කොටස් දෙකකට බෙදෙත්.

ක, ග, ඞ, ච, ජ, ඤ, ට, ඩ, ණ, ත, ද, න, ප, බ, ම, ය, ර, ල, ව, යන අකුරු දහනවය අල්පප්‍රාණ වෙත්. ඊට ශිථිලාක්ෂර යන නාමයද ව්‍යවහාරයි. අල්පප්‍රාණ යන්නෙන් ප්‍රාණ අඩු බව හඟවයි.

ඛ, ඝ, ඡ ඣ, ඨ, ඪ, ථ, ධ, ඵ, භ, ශ, ෂ, ස, හ, යන දසසතර **මහාප්‍රාණ** නම්. ඊට ධනිතාක්ෂර කියාද ව්‍යවහාරයි. මහාප්‍රාණ යන්නෙන් ශබ්දකිරීමේදී ප්‍රාණය මහත් බව යනු හැඟේ.

22. ව්‍යඤ්ජනයෝ නැවතද **අඝොෂය, ඝොෂය** කියා කොටස් දෙකකට බෙදෙත්.

වර්ගයන්ගේ පළමු දෙවෙනි අකුරුද ශ ෂ ස තුනද විසර්ජනීයයද අඝොෂයෝය. අනික්වා ඝොෂ යෝයි.

ක ඛ ච ඡ ට ඨ ත ථ ප ඵ ශ ෂ ස (අ)ඃ යනු අඝොෂාක්ෂරයි.

ගඝඞ ජඣඤ ඩඪණ දධන බභම යරලවහළ (අං)යනු ඝොෂාක්ෂරයි.

## 6 වෙනි අභ්‍යාස පාඨය.

1. අනතඃස්ථ සහ ඌෂ්මාක්ෂර දෙකක් හෝ වැඩි ගණනක් එක්කොට අර්ථවත් වචන අටක් සාදනු. 2. අඝොෂ සහ ඝොෂාක්ෂර දෙකක් හෝ වැඩිගණනක් එක්කොට අර්ථවත් වෙන වචන අටක් සාදනු. 3. සිථිලාක්ෂර සහ ධනිතාක්ෂර දෙකක් හෝ වැඩිගණනක් එක්කොට අර්ථවත් වචන අටක් සාදනු.

## අක්ෂරයන් උපදින තැන්.

23. අක්ෂරයන් ශබ්දකිරීමේදී ඒවා උගුර ආදි ස්ථානවලින් උපදිත්. ඒ ඇසුරුකොට ඒවාට **කණ්ඨජ** ආදි නාම ව්‍යවහාර වෙත්. ඒ අක්ෂරයන්ගේ උත්පත්තියට උපකාරවන තැන් **කරණ** නම් වෙත්. එහි විශෙෂ විභාග මෙහි පහත දක්වනු ලැබෙත්.

## අක්ෂරයන්ගේ උත්පත්තිස්ථානාදිය.

| අක්ෂර. | උත්පත්ති ස්ථාන. | කරණ. | ඒ අක්ෂරවර්ගවල නාම. |
|---|---|---|---|
| අ ආ ඇ ඈ කඛගඝහ(අ)ඃ | උගුර | උගුර | කණ්ඨජ |
| ඉ ඊ චඡජඣයශ | තල්ල | දිවමැද | තාලුජ |
| ඍ ඎ ටඨඩඪරෂළ | මුදුන | දිවඅග ළඟ | මූර්ධජ |
| ඏ ඐ තථදධලස | දත් | දිව අග | දන්තජ |
| උඌපඵබභ | තොල් | තොල් | ඔෂ්ඨජ |
| ං | නාසය | නාසය | නාසික්‍ය |
| එ ඒ ඓ | උගුර සහ තල්ල | උගුර සහ තල්ල | කණ්ඨතාලුජ |
| ඔ ඕ ඖ | උගුර සහ තොල් | උගුර සහ තොල් | කණ්ඨෝෂ්ඨජ |
| ව | දත් සහ තොල් | දත් සහ තොල් | දන්තෝෂ්ඨජ |
| ඞ | උගුර සහ නාසය | උගුර සහ නාසය | නාසික්‍ය |
| ඤ | තල්ල සහ නාසය | දිව මැද | නාසික්‍ය |
| ණ | මුදුන සහ නාසය | දිවමැද ළඟ | නාසික්‍ය |
| න | දත් සහ නාසය | දිව අග | නාසික්‍ය |
| ම | තොල් සහ නාසය | තොල් | නාසික්‍ය |

සංස්කෘත භාෂායෙහි ජිහ්වාමූලීය, උපධ්මානීය කියා තවත් අක්ෂර දෙකක් තිබේ. ක, ඛ දෙකින් පූර්‍වයෙහිවූ විසර්ජනීය කියවෙන කල ඒ ජිහ්වාමූලීය නම් වේ. ඒ දක්වන ලකුණ "×" යන අන්දමට ලියනු ලැබේ. එහි ශබ්දය ග්‍රීක් X අකුරට කිට්ටුවේ. එහි උත්පත්තිස්ථානය හා කරණය දිවමුල වේ.

ප, ඵ, දෙකින් පූර්‍වයෙහි විසර්ජනීය කියවෙනකල ඒ උපධ්මානීය නම් වේ. ඒ දක්වන ලකුණ "෧" යන අන්දමට ලියනු ලැබේ. එහි ශබ්දය ඉංග්‍රීසි f අකුරට සමයි. එහි උත්පත්තිස්ථානය හා කරණය දෙතොල වේ.

වර්ගාන්තාක්ෂර හා අන්තඃස්ථාක්ෂරයන් සමග යුක්ත වූ හ යන්න ලයෙහි උපදනේ ඖරස්‍ය නම් වේ.

හ, ච, ආදි දෙතැන්හි උපදින අක්ෂරයන්ට මිශ්‍රාක්ෂර යන නාමයද දී තිබේ.

මූර්ධජ යන්නට මූර්ධන්‍ය කියාත්, දන්තජ යන්නට දන්ත්‍ය කියාත්, තාලුජ යන්නට තාලව්‍ය කියාත් ව්‍යවහාර වේ.

**සැලකිය යුතුයි.** සිංහල භාෂාවේ එක එක අක්ෂරයට නියම ශබ්දයක් ඇති නමුත් අ යන්න සංවෘතය, විවෘතය, කියා දෙවිධියකට ශබ්දවේ. සංවෘතයනු හකුළුවා කීමය. විවෘත යනු ඉඩහැර කීමය.

ගාත්‍රාක්ෂාරාරූඪවූ අකාරය සංවෘතව හා විවෘතව කියවන හැටි පහත දක්වන උදාහරණ වලින් තේරුම් ගත යුතුයි.

| සංවෘතව කියනතැන්. | විවෘතව කියනතැන්. |
| --- | --- |
| **ක**ළු දෙය | **කා**ලය |
| **ක**රන වැඩ | **කා**රණ විබත් |

| සංවෘතව කියනතැන්. | විවෘතව කියනතැන් |
| --- | --- |
| වන (වීමෙහි) | වන (කැලෑ) |
| වල (විභක්ති ප්‍රත්‍යය) | වල (කැලෑ) |

යටකීශබ්දාදියේ හැර අවශෙෂ ශබ්දවල මුලින්පිහිටි හෝ මූල ගනකුර ඇති අයන්න විවෘතවද අනික්තැන්වල පිහිටි අයන්න සංවෘතවද බහුල වශයෙන් කියවේ.

### ලඝු ගුරු වින්‍යාසය.

24. හල් අකුරක මාත්‍රා ප්‍රමාණය ½ ය හෙයින් ව්‍යඤ්ජනයක ලඝු ගුරු භාවය නිශ්චය කරන්නේ ඊට ආරූඪවී ඇති ස්වරයේ අන්දමටය. ස්වරවත්ව නැති කල ඒ ගණන්ගනු නොලැබේ.

හ්‍රස්ව ස්වරවත් ව්‍යඤ්ජනය ලඝු නම් වේ. දීර්ඝ ස්වරවත් ව්‍යඤ්ජනයද ගුරු නම් වේ. අනුස්වාර, විසර්ජනීය, සංයොගය, හල්අකුර, ජිහ්වාමූලිය, උපධ්මානීය යන මෙයින් පූර්ව සිටි හ්‍රස්වයද ගුරුවේ. ස්වරයන්ගේ ලඝු ගුරු භෙදය මිට ප්‍රථම දක්වන ලදි. ලඝු ගුරු ඇඳිනිම ඇඳ බැලීමෙන් පුරුදු කටයුතුයි. ලඝු සලකුණු කරනකලැ ඍජු රේඛාවක්ද, ගුරු සලකුණු කරනකලැ වඞ්ක රේඛාවක්ද අඳින්නේය.

එ ක මා ත්‍රඃ හ්‍ර ස්වො හ වෙ ත්
⏑ — ⏑ ⏑ ⏑ ⏑ — ⏑

ව්‍ය ඤ්ජ න න්තු අ ර්ධ මා ත්‍ර කං
⏑ — ⏑ — ⏑ — ⏑ — ⏑

### 7 වෙනි අභ්‍යාස පාඨය.

"ලාංකිකයන්ගේ ජන්ම භාෂාවවූ සිංහල භාෂාව පිළිබඳව විද්‍යමාන වන්නාවූ එකම ව්‍යාකරණ ග්‍රන්ථය නම් මහාමහොපාධ්‍යාය වෙදෙහ ස්ථවිරයන් වහන්සේ විසින් රචනාකර වදාළ සිදත්සඟරාවයි" යන

වාක්‍යයෙහි අක්ෂරයන්ගේ උත්පත්තිස්ථාන හා කරණ දක්වනු. එහි ශබ්ද ප්‍රස්තාරයෙහි ලා ලඝු ගුරු ලකුණු කොට පෙන්වනු.

---

## II. නාමයන්ගේ ලිඞ්ග සහ වචන.

### Gender and Number of Nouns.

---

25. නාම නම් සත්වයන්ට හෝ ද්‍රව්‍යවලට කියන නමුයි.

මිනිසා, සිංහයා, දුවන්නා, ගස, ගම, ගෙදර, කෑම, දීම, කළු, රතු යන මේ ශබ්ද නාමයි.

නාමපදයන්ට ලිඞ්ග සහ වචන ඇත්තාහ.

26. ස්ත්‍රී පුරුෂ විශෙෂය හඟවන්නේ ලිඞ්ග නම්. පුරුෂයන්ට නොහොත් පිරිමි සතුන්ට කියන නම් පුරුෂ ලිඞ්ගයි. ස්ත්‍රීන්ට නොහොත් ගැහැනු සතුන්ට කියන නම් ස්ත්‍රීලිඞ්ගයි.

මිනිසා, ගොනා යනාදි නාම පුරුෂ ලිඟුයි.

ගෑනි, දෙන යනාදි නාම ස්ත්‍රී ලිඟුයි.

27. සාමාන්‍යයෙන් මුල් ශබ්දයට "ඊ" ප්‍රත්‍යය වැටීමෙන් ස්ත්‍රී ලිඞ්ගික ශබ්දය සෑදේ. නුමුත් සමහර තැනක මුල් ශබ්දයට අන්‍ය ශබ්දයක් එකතුවීමෙන්ද, සමහර තැනක අමුතු වචනයක් ඇතිවීමෙන්ද ස්ත්‍රී ලිඞ්ගික ශබ්දය ව්‍යවහාර වේ.

1. ඊ ප්‍රත්‍යය වැටීමෙන් ස්ත්‍රී ලිඞ්ගික ශබ්ද සෑදෙන සාමාන්‍ය විධියේදී බොහෝවිට මුල් ශබ්දවල ස්වරාදීන්ගේ විපර්‍ය්‍යාසයද සිදුවේ. මෙහි පහත දක්වන ශබ්දවලින් ඒ ප්‍රකාශවේ.

| මුල්ශබ්ද. | පුරුෂලිඞ්ගික ශබ්ද. | ස්ත්‍රීලිඞ්ගික ශබ්ද. |
|---|---|---|
| ඇඳුරු | ඇඳුරා | ඇඳුරී |
| ඌරු | ඌරා | ඌරී |
| කන් | කනා | කනී |
| කුකුළු | කුකුළා | කිකිළී |
| කුමර | කුමරා | කුමරී |
| පැටි | පැටියා | පැටී |
| බළල් | බළලා | බැළලී |
| බමුණු | බමුණා | බැමිණී |
| බිහිරි | බිහිරා | බිහිරී |
| මහලු | මහල්ලා | මැහැලී |
| මකුණු | මකුණා | මැකිණී |
| මුගටි | මුගටියා | මුගටී |
| යහළු | යහළුවා | යෙහෙළී |
| සතුරු | සතුරා | සැතිරී |

ඇතම්විට ඊ ප්‍රත්‍යය වැටීමට ප්‍රථම අකුරක් එකතුවේ, නොහොත් ද්විත්වවේ.

| මුල්ශබ්ද | පුරුෂලිඞ්ග | ස්ත්‍රීලිඞ්ග |
|---|---|---|
| ඇත් | ඇතා | ඇතිනි* |
| නයි | නයා | නැයිනි |
| කොක් | කොකා | කෙකිනි |
| බලු | බල්ලා | බැල්ලි |
| දුවනු | දුවන්නා | දුවන්නි |
| සුදු | සුද්දා | සුද්දි |

2. මුල් ශබ්දයට ස්ත්‍රීවාචක වෙන ශබ්දයක් එකතුවීමෙන් ස්ත්‍රීලිඞ්ගික ශබ්ද සෑදෙන අන්දම පහත දක්වන ශබ්දවලින් ප්‍රකාශවේ.

---

* ඇතින්නී, ඇතින්න කියාත් ව්‍යවහාරවේ. ඇතිනි, යකිනි, ආදී තන්වලැ ඇත්තේ "ඉනි" ප්‍රත්‍යයයි කිසිවෙක් සලකති.

| මුල්ශබ්ද | පුරුෂලිඞ්ග | ස්ත්‍රීලිඞ්ග |
| --- | --- | --- |
| කොටි | කොටියා | කොටිදෙන් |
| සිංහ | සිංහයා | සිංහධෙනු |
| හංස | හංසයා | හංසධෙනු |
| මී | මීමා | මීදෙන් |
| දෙවි | දෙවියා | දෙවිදූ |
| ගුරුළු | ගුරුළා | ගුරුළුමෙණෙවි |

3. ස්ත්‍රීලිඞ්ගික ශබ්දයට අමුතුම ශබ්දයක් ඇතිවීම මෙහි පහත දක්වන ශබ්දවලින් ප්‍රකාශවේ.

| පුරුෂලිඞ්ගික ශබ්ද | ස්ත්‍රීලිඞ්ගික ශබ්ද |
| --- | --- |
| අස් | වෙළඹ |
| ගොන් | දෙන් |
| පිය | මව් |
| පුත් | දූ |
| පුරිස් | ඉතිරි, කත් |
| මයිල් | නැදි |
| මිනිස් | ගෑනු |
| මොනර | සෙබඩ |
| රජ | බිසෝ * |
| රාළහාමි | ලමාඑතනී |
| සැමි | අඹු |

28. යට දැක්වූ තුන් ක්‍රමයටත් වෙනස්වූ ඇතම් ස්ත්‍රීවාචක ශබ්ද සෑදෙත්. ඒ මෙලෙසයි:- සොරා, සෙර; කොරා, කෙර; ගරඬ, ගැරඬි; කොල්ලා, කෙල්ල ආදිය මෙනි.

29. පුරුෂ ස්ත්‍රී ලිඞ්ග දෙකටම සමහර ශබ්ද ව්‍යවහාරකරත්. මම, අපි, තෝ, තෙපි යන සර්වනාම පදද, ළමා, දෙවතා ආදි ශබ්දද, හොඳ, සුදු, රතු ආදි විශෙෂණ ශබ්දද, විලිඞ්ගික නොහොත් සමලිඞ්ගිකයි.

---

* මෙහෙසි, කියාත් ව්‍යවහාරවේ.

1. මම යනු පුරුෂයෙකු විසින් හෝ ස්ත්‍රියකු විසින් තමන් ගැන කථාකිරීමේදී ව්‍යවහාර කළ හැකිය.

2. ළමා ආදි ශබ්ද සමලිඞ්ග සෙයින් පුරුෂ වාචකව කියයුතු තැනේදි පිරිමිළමයා කියාද, ස්ත්‍රී වාචකව කියයුතු තැනේදි ගැහැනුළමයා කියාද ව්‍යවහාරවෙත්.

3. විශෙෂණ ශබ්ද ඒ සම්බන්ධවන නාමපදයේ ලිඞ්ගයම භජනයකරන හෙයින් ඒවාද විලිඞ්ගකයි. "හොඳ" යන විශෙෂණ පදය හොඳ මිනිහා කියා පුරුෂ වාචකවද, හොඳ ගැහැනි කියා ස්ත්‍රීවාචකවද යෙදියහැකිවේ.

---

## 8 වෙනි අභ්‍යාස පාඨය.

1. මෙහි පහත දක්වන නාම ශබ්දයන්ගේ ස්ත්‍රීලිඞ්ගිකශබ්ද කියනු. රිළවා, තරුණා, කොටා, රජා, මුවා, ව්‍යඝ්‍රයා, මහත්මයා, හොරා, මහණා, බමරා, දෙබරා, කුරුල්ලා, මිල්ලී, වඳුරා, අරක් කැමියා.

2. මෙහි පහත දක්වන නාමයන්ගේ පුරුෂ ලිඞ්ගික ශබ්ද කියනු. හාමිනේ, නැන්දා, කොමලී, කුඳී, මෙහෙසි, සැපින්න, නාරි, අක්කා, දාසී, නැගනී, දූරි, සෙබඩ.

3. මෙහි පහත දක්වන ප්‍රකෘති ශබ්දයන්ගෙන් සිඞවන පුරුෂ ලිඞ්ගික සහ ස්ත්‍රීලිඞ්ගික පද ලියනු. ගොවි, ගුරු, දෙව්, කළු, කොර, කොවුල්, කවුඩු, පරවි, වලස්, මැසි, එළු.

## අප්‍රාණික ශබ්දයන්ගේ ලිඞග විභාගය.

30. මාගධ සංසකෘත භාෂාවල පුල්ලිඞගිකය, සත්‍රී ලිඞගිකය, නපුංසක ලිඞගිකයයි ප්‍රභෙද තුනක් ඇති වේ. නුමුත් ශුඬ සිංහලෙහි ප්‍රකටවන්නේ පුරුෂ ලිඞග සත්‍රීලිඞග දෙක පමණකි. මාගධ සංසකෘත භාෂාවල අප්‍රාණික ශබ්ද සියල්ලම නපුංසක ලිඞගික නොවේ. ඇතම් ශබ්ද පුල්ලිඞගයි. ඇතම් ඒවා සත්‍රීලිඞගයි. කොටසක් නපුංසක ලිඞගිකයි. එබැවින් මුල් භාෂාවල පුල්ලිඞගික ශබ්දවලින් බිඳී ආ ශබ්ද සිංහල භාෂාවෙත් පුරුෂ ලිඞගිකයි. සත්‍රීලිඞගික ශබ්දවලින් බිඳී ආ ශබ්ද සත්‍රීලිඞගිකයි. නුමුත් නපුංසක ලිඞගික ශබ්දවලින් බිඳීආ ශබ්ද සිංහලභාෂාවේ පුරුෂ ලිඞගිකයි. උදාහරණ:- ලෝ, සමුදුර, තලා, ගම්, මග ආදි ශබ්ද සංස්කෘත මාගධ පුංලිඞගික ශබ්ද වලින් බිඳීආ හෙයින් සිංහල භාෂාවෙත් ඒ පුරුෂ ලිඞගිකකොට සලකනු ලැබෙත්.

ඇඟිලි, ගං, මිහි, වැව්, දළ, කැකිරි, ආදි ශබ්ද සත්‍රීලිඞගික මාතෘ භාෂා ශබ්දවලින් බිඳී ආ හෙයින් සිංහලෙහිත් සත්‍රීලිඞගිකයි.

අකුරු, ඇට, බත්, විස, සොහොන්, කසුන්, ගත්, පත්, ආදි ශබ්ද නපුංසක ලිඞගික මාතෘ භාෂා ශබ්ද වලින් බිඳී ආ හෙයින් සිංහලෙහිද පුරුෂ ලිඞගික කොට සලකනු ලැබෙත්.

31. සිංහල භාෂායෙහි මේ ලිඞග විභාග ක්‍රමය මාතෘ භාෂා නොදැන කලහැකි නොවේ. මාතෘ භාෂා වලට ඒ ක්‍රමය ගම්යම් කරුණුනිසා ප්‍රයොජනවෙතත් කථාවෙහි ව්‍යවහාර භාෂාවක්වූ සිංහලට ඒ ක්‍රමය පිරිමැසේයයි අපි නොසිතමු. ඉංග්‍රිසි ආදි ඇතම් භාෂාවල මෙන් සියලුම අප්‍රාණික ශබ්ද නපුංසක ලිඞගික කොට සැලකීම සිංහල භාෂාවටද ඉතා පහසුවේ.

32. නාමයන්ට **එකවචනය, බහුවචනය** කියා සංඛ්‍යා දෙකක් තිබෙත්.

33 එක සත්වයකු හෝ එක දෙයක් ප්‍රකාශකරන ශබ්ද එක වචනය නම්වේ.

මිනිහා, ගොනා, ගස, ගම, යනමේ ශබ්ද එකවචනයි.

34 එක සත්වයෙකුට හෝ එකදෙයකට වැඩිගණනක් ප්‍රකාශකරන ශබ්ද බහුවචන නම් වෙත්.

මිනිස්සු, ගොන්නු, ගස්, ගම්, යනමේ ශබ්ද බහුවචනයි.

35 එකකට වැඩි ගණනක් ඇතත් සමූහයක් හෝ ජාතියක් වශයෙන් යමක් සලකන කල එකවචනයෙන්ම කියනු ලැබේ.

ජනයා, සේනාව, වතුර, හාල, බත, යනාදිය එක වචන කොට සලකනු ලැබේ. මේ ශබ්ද සමූහ එකකට වඩා වැඩි ගණනක් දක්වන තැන බහුවචනයෙහිද යෙදෙත්. ජනයෝ, සේනාවෝ ආදි වශයෙනි.

36 ඇතම් එකාර්ථ නාමයෝ ගෞරවාර්ථයෙහි බහුවචනකොට සලකනු ලැබෙත්.

රජ්ජුරුවෝ, පණ්ඩිතයෝ, පියාණෝ, මෑණියෝ, ගුරුන්නාන්සේ ආදිය බහුවචනයි.

37 කිරි, පැනි, රත්, රිදී, ආදි මැනීමෙන් හෝ කිරීමෙන් ප්‍රමාණකොට ගන්නා ශබ්ද බහුවචන කොට ඇතම් අය සලකත්. කිර, පැනිය ආදිය ඒවායේ එකවචනවේ.

### එකවචන බහුවචන සෑදෙන විධි.*

38 එකවචනාර්ථ සප්‍රාණික ශබ්ද ආ, ඉ, ආදි ප්‍රත්‍යයන්ගෙන්ද, බහුවචනාර්ථ සප්‍රාණික ශබ්ද, උ,

---

* මෙහි දක්වන්නේ නාමවිභක්ත්‍යන්ත ශබ්ද නොව නාම මාත්‍රය දක්වන ශබ්ද වෙත්.

ඕ, ලා, ආදි ප්‍රත්‍යයන්ගෙන්ද, අප්‍රාණික එකවචනාඝී ශබ්ද අ,ඒ, ආදි ප්‍රත්‍යයන්ගෙන්ද බහුවචනාඝී ශබ්ද වල් ආදි ප්‍රත්‍යයෙන්ද සිඩවෙත්.

1. උ ප්‍රත්‍යයෙන් බහුවචන සෑදෙන ශබ්ද

| එකබස | බහුබස | එකබස | බහුබස |
|---|---|---|---|
| බමරා | බමරු | මින්සා | මිනිස්සු |
| ගෑනි | ගෑනු | බලිලා | බළල්ලු |
| ගොනා | ගොන්නු | ගුරුවරයා | ගුරුවරු |

2 ඕ ප්‍රත්‍යයෙන් බහුවචන සෑදෙන ශබ්ද.

| එකබස | බහුබස | එකබස | බහුබස |
|---|---|---|---|
| කොල්ලා | කොල්ලෝ | පණ්ඩිතයා | පණ්ඩිතයෝ |
| කොවුලා | කොවුලෝ | කවුඩුවා | කවුඩෝ |

3 ලා ප්‍රත්‍යයෙන් බහුවචන සෑදෙන ශබ්ද.

| එකබස | බහුබස | එකබස | බහුබස |
|---|---|---|---|
| මාමා | මාමාලා | ගමරාල | ගමරාලලා |

4 වල් ප්‍රත්‍යයෙන් බහුවචන සෑදෙන ශබ්ද.

| එකබස | බහුබස | එකබස | බහුබස |
|---|---|---|---|
| රට | රටවල් | පාර | පාරවල් |
| ගේ | ගෙවල් | දොර | දොරවල් |

මෙකී විධියට වෙනස්වද සමහර ශබ්දවල එකවචන බහුවචන සෑදෙත්.

| සප්‍රාණික ශබ්ද. | | අප්‍රාණික ශබ්ද. | |
|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| ළමයා | ළමයි | කද | කත් |
| ලිය | ලියෝ | පොරව | පොරෝ |

39 ඇතම් ශබ්දවල බහුවචනය ප්‍රකෘති ශබ්දයම වේ. කොටි, පුටු, බටු, ආදිය මෙනි.

40 කොළඹ, සැරියුත් ආදි ස්ථානයක හෝ කෙනෙකුගේ සංඥා නාම ශබ්දවලට බහුවචන නොමැතිය.

### 9 වෙනි අභ්‍යාස පාඨය.

මෙහි පහත දක්වන ශබ්දවල බහුවචන කියනු.
බල්ලා, දෙන, කොටියා, හොරා, ඌරා, වලසා, මැඩියා, අයියා, අක්කා, ගම, වැඩපල, දෙමළා.

මෙහි පහත දක්වන ශබ්දවල එකවචන කියනු.
ගස්, පොල්, මල්, පොලු, හාල්, කතුරු, වැල්, කුඹුරු.

### 10 වෙනි අභ්‍යාස පාඨය.

1. මෙහි පහත දක්වන ශබ්දවල ස්ත්‍රීලිඞ්ගික බහුවචන දෙනු.
මිනිහා, බමුණා, මහල්ලා, මයිල්, මොනර, සැමි, හංසයා, සුද්ද, පුතා, අසු, එත්නා, බලත්නා, යහළුවා, ගෝනා, ගුරුවරයා.

2. බහුවචන නොමැති ශබ්ද පහක් ලියනු.

3. හොඳ මිනිහා, රතුගොනා, තරක ළමයා, කළු එලදෙන, යන පාඨයන්ගේ හොඳ, රතු, තරක, කළු යන ශබ්ද කුමක් ලිඞ්ගිකද.

### ක්‍රියාපදයන්ගේ සාමාන්‍යයෙන් ව්‍යවහාර කාලත්‍රය.

Three tenses of Verbs in Common use.

---

41 කිරීම්, වීම්, ආදිය හඟවන පද ක්‍රියා පදයි. මීට ආඛ්‍යාත පදයයිද කියනු ලැබේ.

“ළමයා පොත කියවයි” කී කල “කියවයි” යන්නෙන් ළමයා කරන ක්‍රියාවක් පෙන්වා දෙයි. එනිසා කියවයි යන්න ක්‍රියා පදයකි. ගස විසාල විය, කීකල විය යන්නෙන් ගසටවූ වෙනසක් පෙන්වාදෙයි. එනිසා විය යන්න ක්‍රියා පදයකි.

42 ක්‍රියාපදයට කාල තුනක් තිබේ. එනම්:- අතීත, වර්තමාන, අනාගත යනුයි.

1 පසුගිය කාලයෙහිවූ ක්‍රියාව **අතීතයි.** "මිනිහා බත්කෑවේය" කීකල කෑවේ යන්නෙන් නිමවුණු ක්‍රියාවක් පෙන්වා දෙයි. ඒනිසා කෑවේය යනු අතීත කාල ක්‍රියාවකි.

2 දැන් පවතින ක්‍රියාව **වර්තමානයි.** "මිනිහා බත් කයි" කීකල කයි යන්නෙන් දැන් කරන ක්‍රියාවක් පෙන්වාදෙයි, ඒ නිසා කයි යනු වර්තමානකාල ක්‍රියාවකි.

3 පටන් නොගත් මතු කරන්ට තිබෙන ක්‍රියාව **අනාගතයි.** "මිනිහා හෙට පලතුරු කන්නේය" කී කල කන්නේය යන්නෙන් පටන් නොගත් ක්‍රියාවක් පෙන්වා දෙයි. ඒනිසා කන්නේය යනු අනාගත කාල ක්‍රියාවකි.

## 11 වෙනි අභ්‍යාස පාඨය.

මෙහිපහත ඇති වාක්‍යවල ක්‍රියාපද වෙන්කොට ඒවා මොනකාලවලට අයත්දැයි කියනු.

1 අරක්කැමියා බත පිසයි. 2 ළමයා ගෙදර ගියේය. 3 කොටියා නිදයි. 4 ඔහු එන්නේය. 5 ගස කැඩුණේය. 6 ගේ දැවේය. 7 විලියම් හෙට කොළඹ යන්නේය. 8 බල්ලා බුරයි. 9 ජෝන් හෙට එන්නේය. 10 කුමාරයා රජවිය.

## පුරුෂ සහ වචන.

### Persons and Numbers.

43 ක්‍රියා පදවලට පුරුෂ තුනක්හා වචන දෙකක් වෙත්. එනම්:– උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ, සහ එක වචන, බහුවචන යනුවෙත්.

1 මම යන සර්වනාම පදය **උත්තම පුරුෂ** එකවචනයයි කියනුලැබේ. ඒසමග බැඳෙනක්‍රියාවෝද උත්තම පුරුෂ එකවචනයෙහි යෙදිය යුත්තෝය. "මම

ගියෙමි" කීකල මම යන්න හා බැඳෙන ගියෙමි යන ක්‍රියා පදයද උත්තම පුරුෂ එකවචනයෙහි වේ.

2. අපි යන සර්වනාමපදය උත්තම පුරුෂ බහුවචනයයි කියනුලැබේ. ඒ සමග බැඳෙන ක්‍රියාපදයෝද උත්තම පුරුෂ බහුවචනයෙහි යෙදිය යුත්තෝය. "අපි ගියෙමු" කීකල "අපි" යන්න හා බැඳෙන "ගියෙමු" යන ක්‍රියාපදයද උත්තම පුරුෂ බහුවචනයෙහිවේ.

3. තෝ නොහොත් උඹ යන සර්වනාම පදය මධ්‍යම පුරුෂ එකවචනයයි කියනුලැබේ. ඒ සමග බැඳෙන ක්‍රියාපදයෝද මධ්‍යම පුරුෂ එකවචනයෙහි යෙදිය යුත්තෝය. "උඹ ගියෙහි" කී කල උඹ යන්න හා බැඳෙන ගියෙහි යන ක්‍රියාව මධ්‍යම පුරුෂ එකවචනයෙහි වේ.

4. තොපි නොහොත් උඹලා යන සර්වනාම පදය මධ්‍යම පුරුෂ බහුවචනයයි කියනුලැබේ. ඒ සමග බැඳෙන ක්‍රියාපදයෝද මධ්‍යම පුරුෂ බහුවචනයෙහි යෙදිය යුත්තෝය. "උඹලා ගියහු" කීකල උඹලා යන්න හා බැඳෙන ගියහු යන ක්‍රියාව මධ්‍යම පුරුෂ බහු වචනයෙහි වේ.

5. ඌ, ඔහු, ඒ, මේ ආදි සර්වනාම පද ප්‍රථම පුරුෂ එකවචනයයි කියනුලැබේ. ඒවා සමග බැඳෙන ක්‍රියාපදයෝද ප්‍රථම පුරුෂ එකවචනයෙහි යෙදිය යුත්තෝය. "ඌගියේය" කීකල ඌයන්න හා බැඳෙන ගියේ යන ක්‍රියාව ප්‍රථම පුරුෂ එකවචනයෙහි වේ.

6. ඌලා, ඔව්හු, ඒවා, මේවා ආදි සර්වනාම පද ප්‍රථම පුරුෂ බහුවචනයයි කියනු ලැබේ. ඒවා සමග බැඳෙන ක්‍රියාපදයෝද ප්‍රථම පුරුෂ බහුවචන

යෙහි යෙදිය යුත්තෝය. "ඔව්හු ගියෝය" කී කල
ඔව්හු යන්න හා බැඳෙන ගියෝය යන ක්‍රියාව ප්‍රථම
පුරුෂ බහුවචනයෙහි වේ.

7. උත්තම පුරුෂ වර්තමාන කාල එකවචන
ක්‍රියාව "යමි" කියාද බහුවචන ක්‍රියාව "යමු"
කියාද මධ්‍යම පුරුෂ වර්තමාන කාල එකවචන ක්‍රියාව
"යෙහි" කියාද, බහුවචන ක්‍රියාව "යෙහු" කියාද,
ප්‍රථම පුරුෂ වර්තමානකාල එකවචන ක්‍රියාව
"යෙයි" කියාද, බහුවචන ක්‍රියාව "යෙති" කියාද,
උත්තම පුරුෂ අනාගතකාල එකවචන ක්‍රියාව "යන්
නෙමි" කියාද බහුවචන ක්‍රියාව "යන්නෙමු" කියාද
මධ්‍යම පුරුෂ අනාගතකාල එකවචන ක්‍රියාව "යන්
නෙහි" කියාද බහුවචන ක්‍රියාව "යන්නහු" කියාද ප්‍ර
ථම පුරුෂ අනාගතකාල එකවචන ක්‍රියාව "යන්නේ"
කියාද බහුවචන ක්‍රියාව "යන්නෝ" කියාද, යන
ක්‍රමයට ක්‍රියාපද යොදාගනු ලැබෙත්.

**සැලකිය යුතුයි.** (1) නාමපද සියල්ලම ප්‍රථම පුරුෂ
යට අයිතිවේ. ඒ හා බැඳෙන ක්‍රියාපදද ප්‍රථම
පුරුෂයෙහිවේ.

(2) කථා ව්‍යවහාරයෙහිදී පුරුෂගැන හෝ
වචනගැන සැලකීමක් නොකොට ක්‍රියාපද යොදනු
ලැබෙත්. මම ගියා, අපි ගියා, උඹ ගියා, උඹලා ගියා,
ඔහු ගියා, උඹලා ගියා, ආදි වශයෙනි.

## 12 වෙනි අභ්‍යාස පාඨය.

මෙහි පහත දක්වන වාක්‍යයන්හි ඇති ක්‍රියාපද
කුමන පුරුෂ හා වචනවලට අයත්ද?

(1) ගවයෝ තණ කති. අපි පාඨශාලාව
ගියෙමු. (3) හෙට ජෝන් එන්නේය. (4) බ
ල්ලෝ බුරති. (5) නුඹලා කොහේ ගියහුද? (6) මෙ

ගෙදර යන්නෙමි. (7) ඔව්හු කොයිබසිට ආවෝද? (8) ස්ත්‍රීහු හෙට වන්දනාවට යන්නෝය. (9) රජ සවගීසථවිය. (10) කාලය අනගිවේ.

## 13 වෙනි අභ්‍යාස පාඨය.

මෙහි පහත දක්වන පාඨයන්හි ඉරිගසා ඇති තැන් සුදුසු වචනවලින් පුරවනු.

1—ගෙදර ගියෝය. 2 ජෝන් පොත—. 3—බත් කෑවෙමි. 4 නුඹලා කොළඹ—. 5—බුරති. 6 අපි පාඨශාලාවට—. 7—බුලත් කෑවෙහිද? 8 මම හෙට කොළඹ—. 9 එළදෙනගෙන් කිරි—. 10—පෑනක් බණ්ඩාට—.

## කර්තෘ, කර්ම, ක්‍රියා යන මොවුන්ගේ ඉතා ලුහුඬු විශෙෂණයන් ඇති පහසු වාක්‍යයන් තැනීම.

Construction of easy Sentences with the Simplest extention of Subject, Predicate and Object.

---

### කර්තෘ හා කර්ම.

44. යම් ක්‍රියාවක් කරන තැනැත්තේ **කර්තෘ** යයි කියනු ලැබේ. කර්තෘකරන ක්‍රියාවට යටත්වන පදාර්ථය **කර්මය** වේ.

“වඩුවා පුටුව සාදයි” කීකල සාදයියන ක්‍රියාව කරන්නේ වඩුවායි. එබැවින් වඩුවා කර්තෘවේ. සාදයි යන ක්‍රියාවට යටත්වන්නේ පුටුවයි. එබැවින් පුටුව යනු කර්මය වේ.

45 කර්තෘ, කර්ම, ක්‍රියා යන තුන එකට යෙදූ කල්හි වාක්‍යයක් සෑදේ, එබැවින් වඩුවා පුටුව සාදයි කීකල සම්පූර්ණ අර්ථයක් හඟවන වාක්‍යයක් ඇතිවේ.

46 ඇතම් ක්‍රියාවලට කර්මයක් වුවමනා නොවේ. "ළමයා නිදයි" කීකල, නිදයි යන ක්‍රියාවට යටත් වන කර්මයක් නොමැත්තේය. නුමුත් එයින් සම්පූර්ණ අර්ථයක් ඇඟවීම් කෙරේ.

එබැවින් කර්මයක් ගන්න ක්‍රියාවලට සකර්මක ක්‍රියා කියාද, කර්මයක් වුවමනා නොවෙන ක්‍රියාවලට අකර්මක ක්‍රියා කියාද කිඅනු ලැබෙත්.

47 සම්පූර්ණ අර්ථයක් ගෙනදෙන වාක්‍යයක් ඇති වීමට කර්තෘ, ක්‍රියා, යන දෙදෙන අවශ්‍ය බව යට කී කරුණුවලින් පැහැදිලිවේ.

48 කර්මය දක්වන සප්‍රාණික ශබ්දවල බහුවචන "න්" යන්නෙන් කෙළවරවෙත්. මිනිසුන්, ගෑනුන්, ළමයින්, බළලුන් ආදි වශයෙනි.

## 14 වෙනි අභ්‍යාස පාඨය.

1 මෙහි පහත දක්වන වාක්‍යවල කර්තෘ, කර්ම, වෙන්කොට පෙන්වා දෙනු.

1 ගොනා තණ කයි. 2 ළමයා ගෙදර ගියේය.
3 අපි සෙල්ලම් කරමු. 4 බළල්ලු මියන් අල්ලති. 5 ගුරුවරයෝ අකුරු උගන්වති.

2 ගියේය, මැරුවේය, කෑවෝය, දුටිමි, රකිත්තේය, යන ක්‍රියාවලට සුදුසු කර්තෘ, කර්ම, යොදා වාක්‍ය පහක් තනනු.

3 කර්තෘ සහ ක්‍රියාව පමණක් ඇති වාක්‍ය පහක් සාදනු.

## කර්මය දක්වන සර්වනාම පද.

49 කර්මය දක්වන පදයක් මෙන් යෙදෙන කල "මම" යන්න "මා" කියාද, "තෝ" යන්න "තා" කියාද, "අපි" යන්න "අප" කියාද, "තොපි"

යන්න "තොප" කියාද, "ඔව්හු" යන්නා "ඔවුන්" කියාද, "මොව්හු" යන්න "මොවුන්" කියාද, "උළලා" යන්න "උන්" කියාද, "මූලා" යන්න "මුන්" කියාද යොදනුලැබෙත්.

ඊට උදාහරණ,

උළ **මා** මැරුවේය. ඔහු **තා** නැගිට්ටෙව්වේය. ඈ **අප** නොසැලකුවාය. ඔව්හු **තොප** නැලෙව්වෝය. අපි **ඔවුන්** නුදිටුමු. මිනිස්සු **මොවුන්** නොසලකති. අපි **උන්** ගැලෙව්වෙමු. ඈ **මුන්** බලාගනී.

යටකී වාක්‍යවල කළුඅකුරෙන් ඇති ශබ්ද කර්මය දක්වන සර්වනාම පද වෙති.

## 15 වෙනි අභ්‍යාස පාඨය.

1 වෙන වෙන සර්වනාම පද කර්මය මෙන් යොදා වාක්‍ය අටක් ලියනු.

2 මෙහි පහත දක්වන වාක්‍යවල ඉරි ඇඳ තිබෙන තැන්වලට සුදුසු සර්වනාම පද යොදනු.

1 මම—ගළවමි. 2—ඔවුන් දුටුවෙමු. 3 ඔව්හු ———නොසලකති. 4————තොප දුටුවෝය. 5 මම————එලවන්නෙමි.

## විශෙෂණ.

50. නාම පද හා ක්‍රියා පද විස්තරකරන්ට වුව මනා තැන ව්‍යවහාරකරන ශබ්දවලට **විශෙෂණයයි** කියනු ලැබේ. ගොනා තණ කයි යන වාක්‍යයේ ඇති පදවලට විශෙෂණ යොදා කළුගොනා ලාතණ ඉක්මණින් කයි කියා කියහැකිය. එහි කළු යන ශබ්දය ගොනාගේ ගුණයක් දක්වයි. ලා යන ශබ්ද තණ වල ගුණයක් දක්වයි. ඉක්මණින් යන ශබ්දය ක්‍රියාවේ අන්දම දක්වයි. එබැවින් ඒ ශබ්ද විශෙෂණ නම් වේ.

## 16 වෙනි අභ්‍යාස පාඨය.

1 මෙහි පහත දක්වන වාක්‍යයන්ගේ විශෙෂණ පද වෙන්කොට ලියනු.

1. උස මිනිහා කළු රෙද්දක් ඇඳ සිටියේය. 2 කළු බල්ලා හයියෙන් දිව්වේය. 3 කොර මිනිහා හෙමින් ගමන් කරයි. 4 හොඳ ළමයා නරක වචන නොදෙඩයි. 5 යහපත් ගුරුවරු අලස ළමයින්ට සැරෙන් ක්‍රියා කරනි.

2 මෙහි පහත දක්වන පදවලට සුදුසු විශෙෂණ පද යොදනු.

බල්ලා, කොල්ලා, සොරා, බමුණා, පිය, මව්, කිකිළි දිව්වේය, කෑවේය, හැඬුවේය.

50 ඇතම් ද්‍රව්‍යාදිය දක්වන නාම ශබ්දද වෙන නාමශබ්දයක වර්‍ණනාවක් වශයෙන් යෙදුකල ඒවාද විශෙෂණ කොට සලකත්. "රට ගොනා" කී කල රට යන්න ස්ථානයක නාමයක් වූවත් ගොනාගේ වර්‍ණනාවක් කරන හෙයින් එයද විශෙෂණ ශබ්දයකි. සුරපුර, කොඩිගහ, රන් මාලය ආදිය ඊට තව උදාහරණ වෙත්.

## 17 වෙනි අභ්‍යාස පාඨය.

1. කළු නයෙක් හෙමින් බඩගා ගොස් මිටි තුඹ සකට වැදී එහි සිටි කුඩා සතුන් කන අතර මහලු මුගටියෙක් එහි පැමිණ ඌ මරාදැම්මේය, යන වාක්‍යයෙහි ඇති පදයන්ගේ නම් වෙන වෙනම දක්වනු.

2. ද්‍රව්‍යාදිය දක්වන නාමශබ්ද විශෙෂණ වශයෙන් යෙදෙන තැන් නිදර්‍ශන 10 කින් පෙන්වනු.

3. කර්‍තෘවටද, කර්‍මයටද, ක්‍රියාවටද, විශෙෂණ යොදා වාක්‍ය අටක් තනනු.

## ප්‍ර ශ්න.

## Questions.

1. ශුද්ධ සිංහල හෝඩියේ අක්ෂර 30හ32 වශයෙනුත්, පාළිහෝඩියේ 41ක43 වශයෙනුත්, සංස්කෘත හෝඩියේ 49ය50 වශයෙනුත්, කිසිවිටෙක ගණන් ගැනීමට කරුණුකිම?

2. උත්පත්තිස්ථානයන්ම කරණ බවට පැමිණෙන අක්ෂරයෝ කවරහුද?

3. ලුණු, මැටි, දිය, දුම්, යන ශබ්දයන්ගේ සංඛ්‍යා භේදයද, ඒ, මේ, අර, ඔය, යන ශබ්දයන්ගේ ලිඞ්ග භේදයද පැහැදිලි කරනු?

4. යංශය, රේඵය, අඞ්සංයෝගය, සබ්බබයන්ත, පාළි වයන්ත, යන මේවාට ඒ ඒ නම් කවරහෙයකින් යොදනලදුදැයි දක්වා රූපාකාරයන්ද ලියා සටහන් කරනු?

5. පා, කර, සිටි, හැඬි, යන ධාතූන්ගෙන් කාල, පුරුෂ, සංඛ්‍යා, සෑදෙන ක්‍රියාපද දක්වනු?



